රුහුණ විශ්වවිද්‍යාලය
**2015/2016 ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි - 1000 ස්ථලය**
**දෙවන සමාසික පරීක්ෂණය - 2017 මාර්තු**

## SLS 12513 - සාහිත්‍ය ප්‍රවේශය

**පළමු වෙනි සහ දෙ වෙනි ප්‍රශ්න අනිවාර්ය යි. සෙසු ප්‍රශ්න අතරින් තුනක් තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

**කාලය : පැය 03 යි.**

---

01. පහත දැක්වෙන කාව්‍ය නිර්මාණයෙහි තේමාව කුමක්දැ යි පැහැදිලි කර කවියා විසින් උපයුක්ත කාව්‍යෝක්තිවල ධ්වනිතාර්ථ පැහැදිලි කරන්න.

**සොබා**

සඳ එළිපත්තට ඇවිදින් එළිය එළයි යාන්තමට
තුහු ගජසෙන් මුරට හිඳී වනමඬලේ නිවහන වට
කවුළු පියන් විවර ව ඇත හමනා පිවිතුරු සුළඟට
තුරුළු වුණා වලාකුළක් නිදිබර වූ කඳු මුදුනට

මදිරා රස මිහිර පිරෙයි නොදැනෙන සේ මල් කෙමියට
සුවඳ කියයි ගැබ් ගත් බව පෙරුම් පිරූ බඹරෙකු හට
සිකුරු තරුව පායාලා ඇසි පිය නොහෙළයි තරුකැට
වනන්තරය නිසංසලයි ඉඩහරිමින් මධුසමයට

මා වවුලෙක් ලඹදෙනවා හිත පහළට යටිකුරුවට
වවුල් හපය බිම දැමුණා රසය උරා බී මිහිරට
ගැලූ කඳුළ පිණිමුතු වී තැවරී ඇත මකුළු දැලට
සඳවත තව ලස්සණ විය අවුල්ව ගිය වලාරොදට

වීසි කළා ඇඳි සළුපිළි කඳු වැටියක් දිය ඇල්ලට
පෙණ බුබුළේ ගීතයක්ව එය බැස යයි ගලන ගඟට
විහිළු කළාදෝ මැදියම බකමූණෙක් 'හූම්' හඬට
මිහිදුම ගෙන එයි සීතල දුහුල් සළුව විළි වැසුමට

ගහවැල මල් සවන් යොමයි කාගේවත් කෙඳිරිල්ලට
රෑහැයියනගේ කවිය පුරයි රස හෝරා විරාමයට
වැහිළිහිණිය ඉගිල ගියා හිමිදිරියේ විල්මිටියට
විල බොරවිය මදැ'තෙකුගේ සවිබල පෑ පෙම් කෙළියට

සුනිල් සරත් පෙරේරා

(ලකුණු 15 යි.)



25

02. (අ) පහත දැක්වෙන (i) පාඨයෙහි සහ (ii) කාව්‍ය නිර්මාණයෙහි භාෂා ව්‍යවහාර සම්බන්ධයෙන් දැකිය හැකි විශේෂ ලක්ෂණ හතරක් පැහැදිලි කරන්න.

(i) **වර්ෂාව**

වලාකුළු සෑදී ඇති කුඩා ජල බිංදු එක්ව පෘථිවි පෘෂ්ඨය මත වැටීමෙන් වර්ෂාව ඇතිවේ. වර්ෂාව ඇතිවීමට කරුණු දෙකක් සම්පූර්ණ විය යුතු ය. ප්‍රථමයෙන් ජලවාෂ්ප අඩංගු වාතය අවශ්‍ය ය. දෙවැනිව, එම ජලවාෂ්ප සහිත වායුව ඉහළ නැගීම නිසා සිසිල් විය යුතු ය. ජලවාෂ්ප උරාගැනීම වූ කලි ජලාශය හා ගැටෙන වායුව නිරන්තරයෙන් ම කරන්නෙකි. එසේ ජලවාෂ්ප උරාගත් වායුව සිසිල් වීම ක්‍රම දෙකකට සිදුවිය හැකිය. මේ සිසිල් වීමේ ක්‍රම අනුව අප රටට ලැබෙන වර්ෂාව (අ) සංවහන වර්ෂාව හා (ආ) කඳුකර වර්ෂාව ය යි දෙයාකාර ය.
(අ) දහවල් කාලයේ දී තද සූර්ය තාපය ඇතිවුවහොත් එය වර්ෂාව ඇතිවීමේ ලකුණක් බව කියනු ඔබ අසා ඇත. මේ වර්ෂාව කෙසේ ඇතිවන්නක් දැයි පරීක්ෂා කර බලමු. තද සූර්ය තාපය ඇති දිනවල වායුවට බොහෝ සේ ජලවාෂ්ප අඩංගු වේ. ජලවාෂ්ප වාතය පමණ බර නැත. එබැවින් වාෂ්ප සහිත රත් වූ වායුව ඉහළ නගියි. මෙසේ ජලවාෂ්ප සහිත වායුව ඉහළ නැගීමෙන් කුමක් වේ ද? එහි පීඩනය අඩු වීම නිසා සිසිල් ව, අඩංගු ජලවාෂ්ප කොටසක් ඝනීභවනය වන බව ඔබට වැටහෙනු ඇත. එසේ ඝනීභවනය වූ ජලවාෂ්ප වර්ෂාව මෙන් පහත වැටේ. මේ ක්‍රමයට ඇතිවන වර්ෂාව සංවහන වර්ෂාවයි. සමකාසන්න රටවල අවුරුද්ද මුළුල්ලේ වර්ෂාව ඇතිවන්නේ මේ නයිනි. අප රටට උණුසුම් මාසයක් වූ අප්‍රියෙල් මාසයේ දී හවස් වරුවෙහි ඇතිවන වර්ෂාව ද සංවහන වර්ෂාවයි.
(ආ) මැයි මාසයේ සිට අගෝස්තු මාසය දක්වා අප දිවයිනේ නිරිතදිග ප්‍රදේශයට තද වැහි ලැබෙන බව ඔබ දන්නවා ඇත. මීට හේතුව අප රට හරහා ගමන් කරන සුළඟ ය. මේ සුළඟ ඉන්දියානු මුහුද ඔස්සේ ගමන් කරන බැවින් ජල වාෂ්ප බහුල තෙත් සුළඟෙකි. එසේ හමන සුළඟ අප රටේ මධ්‍යම කඳුවැටිය නිසා ඉහළ නගී. එවිට එහි අඩංගු ජලවාෂ්ප ඝනීභවනය වීම හේතු කොට ගෙන කඳුරටට හා නිරිත දිග ප්‍රදේශවලට වර්ෂාව ලැබේ. කඳුවැටිය පසුකර හමන්නා වූ මේ සුළඟ වියළි ස්වභාවයක් දරයි. මෙවැනි වර්ෂාවලට කඳුවැහි යන නම දී ඇත.

(ii) වැස්ස

චිචිරි චිරි චිචිරි චිරි උදේ සිට ඇද හැලෙන
පොද නොකැඩී තෙත බරිව හිරිකිතෙන් කිලිපොළන
පාර තොට, ගහ කොළ ද වසා ගෙන හැම අතින
වහින වැහි වහින වැහි නොපායන මුළු දවස

ගොහොරු මඩ ඇඹිලි කරු අතර චිරි චිරි ගාන
මඩ කඩිති හැම තැනම මඩ පාට දිය රැඳුණ
අලුත පස් දැමූ පාර දණිහ තෙක් මඩ එරෙන
බැනියම ද ඇඟට ඇලි උදේ සිට තෙත බරි ව

තෙමුණ රෙදි ඇඟ ඇලුණු හබුරු කොළ මලිපිටි ද
දෝර ගොස් හැම තැන ම වක්කලන් ඇලි හැඳුණ
හැට්ට අත් කඳ කලව තෙත රෙද්ද ඇඟ එතුව
වහින වහින වහින වැහි නොපායන මුළු දවස

ඔළුව කෙස් තෙතබරි ව පිට දිගේ වැක්කෙරෙන
කාර් රෝදෙන් 'චිරිස්' ඇඟ පුරා මඩ ඉහෙන
ආයිමත් හිටි ගමන් තද කරන් එන සැණින
වහින වැහි වහින වැනි නොපායන මුළු දවස

ගෙදර ගොස් ඇඳපු දේ මොහොතකින් ඉවර කොට
තුවායෙන් ඇඟපත ද පිස දමා හිස කෙස් ද
තාන් සරමක් ඇඳන් උණට උණු තේ වතුර
ඇඳෙහි ඉඳ උණුසුමට බොන්නෙ කොයි මොහොතෙ දැ යි
වැහි පොදෙහි පෙඟුණු සිත හිත හිතා ළතැවේ ය.

(ආ) පහත දැක්වෙන නිර්මාණයෙහි අරුත වත්මන් සිංහල ව්‍යවහාරයෙන් දක්වන්න.

මෙන් කමලේ දෙන රැව් මිහිලොල්
මුදු තෙපලින් රඳනා හැම කල්
පෙම්බරියේ නුඹ දුන් මෙවදන්
දොම්නස පහ කරවයි සිත් සතන්
නැත බිය මා මනකල්

(ලකුණු 15 යි.)

03. සාහිත්‍ය නිර්මාණ විෂයයෙහි චමත්කාරය යනුවෙන් අදහස් කෙරෙන්නේ කුමක් දැ යි නිදසුන් සහිත ව පහදන්න.

04. ඔබට අභිමත නිර්දිෂ්ට කෙටි කථාවක් ඇසුරෙන් කෙටි කථාවක මූලික ලක්‍ෂණ පැහැදිලි කරන්න.

05. හෙවනැල්ල නවකථාවෙහි ගැටමෙහි ස්වරූපය සහ එහි විකාශනය පැහැදිලි කරන්න.

06. පුද්ගල චිත්ත සන්තාන ගත දුර්වලතා සානුකම්පිත ව විග්‍රහ කිරීමට ගුත්තිල කාව්‍ය කතුවරයා දැක් වූ ශක්‍යතාව උදාහරණ සහිත ව විග්‍රහ කරන්න.

07. හැත්තෑව දශකයේ කවියෙහි සිදු වූ තේමාත්මක වෙනස අභිමත කවීන් තිදෙනෙකුගේ නිර්මාණ ඇසුරෙන් විමසන්න.

(03 - 07 දක්වා පිළිතුරු සඳහා ලකුණු 10 බැගිනි.)

@@@@@@@@@



26